# රැකියා පුරප්පාඩු

## ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික)සමාගම

රජය සතු සමාගමක් වන ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගමේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** **සත්‍යාපන විධායක - තනතුරු සංඛ්‍යාව 01**
**02.** **තත්ත්ව විධායක - තනතුරු සංඛ්‍යාව 01**
**03.** **ව්‍යාපෘති විධායක - තනතුරු සංඛ්‍යාව 01**
**04.** **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) - තනතුරු සංඛ්‍යාව 02**

**01.** **සත්‍යාපන විධායක - තනතුරු සංඛ්‍යාව 01,**
**02.** **තත්ත්ව විධායක - තනතුරු සංඛ්‍යාව 01,**
**03.** **ව්‍යාපෘති විධායක - තනතුරු සංඛ්‍යාව 01**

**ඉහත 1,2 හා 3 තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද**

(පහත 1 හෝ 2 හෝ 3 හෝ 4)

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් භෞතික විද්‍යාව/ ජීව විද්‍යාව/ ඉංජිනේරු විද්‍යාව/ පරිසර විද්‍යාව/ පරිසර කළමනාකරණය/ පරිසර හිතකාමී ව්‍යාපාර කළමනාකරණය/ කෘෂිකර්මය හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

(2) අදාළ විෂය ක්ෂේත්‍රයකින් තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) තනතුරට අදාල විෂය කේත්‍රයේ හත්වැනි මට්ටමට (07) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

(3) අදාළ විෂය ක්ෂේත්‍රයකින් තෘතිය වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කර ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ හයවැනි මට්ටමට (06) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

(4) අදාළ විෂය ක්ෂේත්‍රයකින් තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ පස්වන මට්ටමට (05) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

වයස

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

JM 1-1 – 2025 - රු. (72,650 - 10 x 1,360 - 18 x 2,040 - 122,970)
(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව) සහ අනුමත දීමනා

**04.** කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) - තනතුරු සංඛ්‍යාව 02

තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද

(පහත 1 සහ 2 )

(1) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල/ දෙමළ
ii. ගණිතය
iii. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(2) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (03) ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**වයස**

අවු: 18 ට නොඅඩු හා අවු:45 ට නොවැඩි අය විය යුතුය.

**සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය:**

MA 1-2 - 2025 - රු. (46,220 - 10 x 540- 7 x 630 - 12 x 1,080 - 12 x 1,280 - 84,350)
(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව) සහ අනුමත දීමනා

**පොදු කොන්දේසි**

**සෑම අයදුම්කරුවෙකුම,**

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

(iii) විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතු ය.

(iv) තනතුරට අදාල සුදුසුකම්, අයදුම්පත් යොමු කරන දිනය වන විට සම්පූර්ණ කර තිබිය යුතුය.

(v) තනතුරු කිහිපයක් සඳහා අයදුම් කිරීමට අවශ්‍ය නම්, එම එක් එක් තනතුර සඳහා වෙන්වෙන්ව අයදුම්පත් යොමු කළ යුතුය.

**පත්වීමේ ස්වභාවය**

ස්ථිර, වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබයි, සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

**අයදුම්පත් යොමුකිරිම**

ජාතික හැඳුනුම්පත, සියලුම අධ්‍යාපන සහතික, වෙනත් සුදුසුකම් සනාථ කරන සහතික වල ඡායා පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා 2026.09.09 වැනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ප්‍රධාන විධායක නිලධාරි, ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම, “සොබාදම් පියස”, 2 වන මහල, අංක 416/සී/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම් පත්‍රය බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඔබ ඉල්ලුම් කරන තනතුරට අදාල අංකය හා එම තනතුර පමණක් පැහැදිලිව සඳහන් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ සමාගම් වල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය.

අයදුම්පත් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම සතුය එසේම, ඉහත තනතුරු සියල්ලම හෝ ඉන් එකක් හෝ එකකට වැඩි ප්‍රමාණයක් බඳවා ගැනීමේ හෝ නොගැනීමේ තීරණය ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම සතුය.

සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මුලික සුදුසුකම් නොමැති, අදාළ සහතික වල ඡායා පිටපත් අමුණා නොමැති හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලෙන් අස්ථානගත වන අයදුම්පත් පිළිබඳ ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම වග කියනු නොලැබේ.

ප්‍රධාන විධායක නිලධාරි
ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම
‘‘සොබාදම් පියස’’
2 වන මහල
අංක 416/සී/1, රොබට් ගුණවර්ධන මාවත
බත්තරමුල්ල